**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 29 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලිය රු.30,206 කින් හා ප්‍රාග්ධන වැය රු.12,297,985 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවල නිමකරන ලද කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු රු.16,195,123 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම් සහ ණයහිමියෝ එම වටිනාකමෙන් අඩු වී තිබුණි.

(ඇ) ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම් රු.43,150 ක් අඩුවෙන් ප්‍රාග්ධන ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.7,539,400 ක දායක මුදල් හා දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් පරිත්‍යාග ලෙස ලැබූ රු.204,640 ක් වූ පරිගණක උපාංග ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවන ලද රු.664,006 ක ණය වාරික ගෙවීම් වර්ෂයේ වියදමක් ලෙස හර කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබුණු රු.88,220 ක් වූ බැංකෝ යන්ත්‍ර ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

---------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.91,453,761 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර අසමානතා වල එකතුව රු.11,821,477 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

**(අ) ලැබිය යුතු ගිණුම්**

-------------------

වර්ෂ 03 කට වැඩි කාලයක සිට පැවත එන එකතු වටිනාකම රු.620,949 ක් වූ ආදායම් හා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් රු.12,393,273 ක් ලැබිය යුතුව තිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති 10 ක් සහ ඉකුත් වර්ෂවල සිදුකළ සංවර්ධන ව්‍යාපෘති 12 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.2,458,383 ක් වර්ෂය අවසාන වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

------------------------------------------------

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

-------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,379,291 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම්** |
|---|---|---|
| | **රු.** | |
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | |
| (i) රීති 180 හා රීති 182 | - | මුදල් හෝ ගබඩා භාරව ක්‍රියා කරන නිලධාරීන් හා ආදායම් එකතු කිරීමේ නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (ii) රීති 193 | - | අයවැය සමඟ අතිරික්තතා හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් දෙසැම්බර් 31 දිනට පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) රීති 217 | - | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ලේඛනයක් අංක පී.එස්.46 දරන ආකෘතිය ප්‍රකාරව පවත්වා නොතිබුණි. |
| | (iv) රීති 218 | - | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ සමීක්ෂණය කර වාර්තා කර නොතිබුණි. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 5.1 හා 5.2 වගන්ති | - | ප්‍රධාන කාර්යාලයේ සේවකයින් 15 දෙනෙකු වැටුප් රහිත නිවාඩු දින 466 ක් ලබාගෙන තිබුණි. |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) මුදල් රෙගුලාසි 570 | 743,791 | වර්ෂ 03 කට අධික කාලයක සිට ඉදිරියට ගෙනෙමින් පවතින විවිධ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 1646 | 2,001,982 | 2017 වර්ෂය තුළ වාහන 26 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 1647 | - | සභාව සතු වාහන සඳහා භාවිතා කළ ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබුණි. |

(ඇ) වෙනත් චක්‍රලේඛ

| | | |
|---|---|---|
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | - | සභාව සතු වාහන 16 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,664,055 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,080,170 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,653,000 | 3,653,000 | 3,861,509 | 11,664,450 | 3,553,000 | 3,553,000 | 4,116,121 | 10,287,262 |
| (ii) | කුලී | 4,710,000 | 4,710,000 | 3,764,392 | 3,197,920 | 4,235,000 | 4,235,000 | 3,849,332 | 2,252,312 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,051,000 | 1,051,000 | 1,108,879 | 22,560 | 1,051,000 | 1,051,000 | 1,113,395 | 30,720 |
| (iv) | වෙනත් ආදායම් | 5,537,000 | 5,537,000 | 9,742,120 | 1,515,806 | 4,920,200 | 4,920,200 | 3,795,277 | 1,081,866 |
| | | 14,951,000 | 14,951,000 | 18,476,900 | 16,400,736 | 13,759,200 | 13,759,200 | 12,874,125 | 13,652,160 |

#### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයට අදාළව අයකර ගතයුතු රු.13,940,262 ක් වූ වරිපනම් බදුවලින් රු.3,861,509 ක් පමණක් අයකර ගැනීම නිසා වර්ෂය අවසානයට වූ හිඟ බදු ශේෂය රු.11,664,450 ක් විය. හිඟ මුදල්

අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.2.3 කුලී

-----

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.2,252,312 ක් වූ හිඟ කඩ කුලී ශේෂය වර්ෂය අවසානයට රු.3,197,920 ක් දක්වා වර්ධනය වී තිබූ අතර, වර්ෂය තුළ රු.3,764,392 ක් අයකරගෙන තිබුණි. එය ලැබිය යුතු මුදලින් සියයට 54 ක් තරම් ප්‍රතිශතයක් විය.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.4,935,400 ක් හා මුද්දර ගාස්තු රු.9,765,579 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්යයසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

------------------------------------

2016 වර්ෂයේ මුදල් ලැබී තිබූ ව්‍යාපෘති 07 ක් ද ඇතුළුව රු.1,611,000 ක් වටිනා ව්‍යාපෘති 13 ක් 2018 අගෝස්තු වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘති ආධාර ඇතිව ඉගල්කන්ද ඉඩමේ අක්කර 02 ක භූමිය තුළ කැලි කසළ කළමනාකරණයට ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු 2008 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර, 2018 මාර්තු 05 දින වනවිට ඒ වෙනුවෙන් රු.2,058,123 ක් වැය කර තිබුණි. ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 10 ක් ගත වී තිබුණ ද, වැඩ නිමකර කසළ කළමනාකරණය ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) සභා බල ප්‍රදේශය තුළ දිනකට ටොන් 05 ක පමණ කැලි කසළ එකතු කරනු ලබන අතර, එම කසළ වර්ග කිරීමකින් තොරව ගොඩනැගිල්ල තුළ හා භූමිය පුරා අක්‍රමවත්ව බැහැර කර තිබුණි. මෙම කසළවලින් අතිශයින් දුගඳ වහනය වීම හා මැසි මදුරුවන්ගෙන් පිරී තිබූ අතර, ඉදිරියේ දී සෞඛ්‍ය ගැටළු මතුවීමට ඉඩ ඇති බව නිරීක්ෂණය විය.

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සභාව විසින් හඳුනාගෙන ඇති බව දක්වා තිබුණ ද, 2018 මැයි වනවිටත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ පුද්ගලයින්ගෙන් එක්වන් මුදල් ලබාගෙන 1998 වර්ෂයේ දී ඉදි කරන ලද පොදු වෙළඳපොල අසල කඩ කාමර 12 කින් සමන්විත තනි මහල් ගොඩනැගිල්ල හා කඩ කාමර 18 කින් සමන්විත දෙමහල් ගොඩනැගිල්ල බදු දීමට 2018 මාර්තු 05 දින වනවිටත් කටයුතු කර නොතිබුණි. එක්වන් මුදල් ලබාදුන් ඇතැම් පුද්ගලයින් සභාව සමඟ ගිවිසුම්ගත වීමකින් තොරව කඩ කාමර පවත්වාගෙන යන අතර, කඩ බදුදීම නීත්‍යානුකූල කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2016 නොවැම්බර් 05 දින සිට සේවය හැර ගිය සෞඛ්‍ය කම්කරුවෙකුගෙන් වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයවිය යුතු රු.96,118 ක් අයකර ගෙන නොතිබුණි.

(ඇ) සභාව මඟින් පාලනය වන පුස්තකාල හතරෙන් සාමාජිකයින්ට බැහැරට ගෙන යාම සඳහා 2003 වර්ෂයේ ලබාදුන් රු.101,183 ක් වටිනා පොත් 633 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ආපසු භාර දී නොතිබුණි.

(ඈ) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/02/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව වීථි පහන් ලේඛනයක් නඩත්තු කර, නව වීථි පහන් සඳහා විදුලිබල මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීම සිදුකර නොතිබීම හේතුවෙන් වීථි පහන් නඩත්තු කිරීමට සභාව විසින් දරා තිබුණු රු.863,150 ක වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත ද්විතීයික තනතුරුවල සේවකයින් 05 ක් හා ප්‍රාථමික තනතුරුවල සේවකයින් 10 ක් පුරප්පාඩුව පැවති නමුත් එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ii) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව බඳවාගෙන තිබුණු සේවකයින් 07 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.2,233,475 ක් ගෙවා තිබුණි.

**(ආ) සේවක ණය**

**--------------**

විශ්‍රාම ගිය, ස්ථාන මාරු වී ගිය සේවකයින් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.981,406 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-------------------------------**

සභාව සතු කඩ කාමර 56 ක් සහ පදික කුටි 30 ක් සඳහා පවතින බදු ගිවිසුම් වසර 20 කටත් වඩා පැරණි ඒවා වූ අතර, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක : දපපා/පපාකො/2010/01 චක්‍රලේඛය ප්‍රකාර එම බදු ගිවිසුම් අළුත් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රු.3,197,920 හිඟ කඩ කුලී අයකරගෙන නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

----------------------------

**3.5.1 පවරා නොගත් වත්කම්**

-------------------------

සභාව විසින් භාවිතා කරන ගල්රෝල, කැබ් රථය හා ඩිෆෙන්ඩරයෙහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ට්‍රැක්ටරයක්, ජීප් රථයක්, හා අත් ට්‍රැක්ටරයක්, අළුත්වැඩියා කිරීමෙන් තොරව සහා භූමියෙහි අනාරක්ෂිත ලෙස ගාල් කර තිබුණි.

(ආ) 2015 වර්ෂයේ දී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ට්‍රැක්ටර් රථය කිසිම ධාවන කටයුත්තකට යොදවාගෙන නොතිබුණි.

(ඇ) ඩබල් කැබ් රථයක් හා ටේලර් ජල බවුසරයක් භාවිතයෙන් ඉවත්කර තිබූ අතර, අබලන් වූ වාහන ප්‍රයෝජනයට ගතහැකි ආකාරයට අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීමට අදාළ වූ 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 09 ක රු.23,456,978 ක ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම සියයට 02 සිට සියයට 66 අතර පරාසයක පැවතුණි.

(ආ) ණය ආපසු ගෙවීම් සඳහා අයවැය ලේඛනයෙන් රු.1,601,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, වියදම් දරා නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

----------------------

සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා දෙකක දී අභ්‍යන්තර විගණන නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | <u>පද්ධතිය</u> | | <u>අඩුපාඩුව</u> |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | මූල්‍ය ප්‍රකාශනවල සහ ඊට අදාළ උපලේඛන වල පවතින වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කර නොතිබීම. |
| | | (ii) | නැතිවීම්, හානිවීම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) | ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| | | (ii) | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණ පවත්වා නොතිබීම. |
| | | (iii) | සභාව සතු පොදු ස්ථාන පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ඇ) | සේවක මණ්ඩල කළමනාකරණය | | පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට හා අතිරික්ත සේවකයන් විධිමත් කිරීමට කටයුතු කර නොතිබීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබීම. |
| | | (ii) | කසළ බදු අය කර නොතිබීම. |
| (ඉ) | වාහන පාලනය | (i) | වාහනවල අයිතිය පවරා ගෙන නොතිබීම. |
| | | (ii) | වාහන සම්බන්ධ ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබීම. |
| | | (iii) | වාහන අපහරණය කර නොතිබීම. |
| (ඊ) | අයවැය පාලනය | | අයවැය ඇස්තමේන්තු සහ තථ්‍ය අගයන් කෙරෙහි අවධානය යොමුකර අයවැය ලේඛනය සංශෝධනය කර නොතිබීම. |